ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2022 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

---

**හැඳින්වීම:**

**ව්‍යාපාරික පරිසරය විෂයේ අදියර I සඳහා නියමකර ඇති සියළුම ක්ෂේත්‍ර වාගේ මුළු ප්‍රශ්න පත්‍රයෙන් ආවරණය කර ඇති බැවින් විෂය ක්ෂේත්‍ර පිළිබඳව අයදුම්කරුවන් සමස්ත දැනුම හා අවබෝධය පරීක්ෂාකිරීම අරමුණු කරගෙන තිබුණි. මුළුමනින්ම ගත්කල බොහොමයක් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සාර්ථකව තිබූ අතර, සෙස්සන් හොඳින් උත්තර ලිවීමට අසමත් වී ඇත. වැදගත් කරුණු වටහාගෙන ඉලක්කගත ප්‍රශ්නවලට උත්තර සැපයීමට අපොහොසත් වීමෙන් ප්‍රමාණවත් පරිදි ලකුණු උපයාගැනීමට අයදුම්කරුවන් අපොහොසත් වූ බව නිරීක්ෂණය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය මුළු ප්‍රශ්න පත්‍රයේම සාමාන්‍ය මට්ටමින් ලකුණු ලබාගෙන තිබුණි.**

පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ:

## A - කොටස

### ප්‍රශ්න අංක 01

ව්‍යාපාරික පරිසරය විෂයේ සමස්ත විෂය කරුණු මෙම කොටසින් ආවරණය කර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් 100% ක්ම ප්‍රශ්ණයට උත්තර සපයා තිබුණි. ලකුණු 100 න් 40 ක් වෙන්කර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් බහුතරය ලකුණු 30 - 40 ත් අතර ලබාගෙන තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්න අංක 1.5 - 1.20 සඳහා සාර්ථක ලෙස උත්තර ලියා නොතිබුණි. උත්තර පිළිබඳව නිරීක්ෂණ පහත දක්වා ඇත.

**1.5** අයදුම්කරුවන්ගෙන් බහුතරයක් චෙක්පතක රේඛණයක් අවලංගු කළ හැකි පාර්ශවය දැන සිටියේ නැත. අයදුම්කරුවන් වැඩි දෙනෙකු උත්තර අංක 04 ලකුණු කර තිබුණි.

**1.11** අයදුම්කරුවන්ගෙන් බොහොමයක් මුදල් වෙළඳපොලේ ගනුදෙනුවන උපකරණ හඳුනාගෙන නොතිබූ අතර උත්තර ලියා තිබුණේද නැත.

**1.20** අයදුම්කරුවන් බොහොමයක් බද්ධ ව්‍යාපාරයක ලක්ෂණ දැන නොසිටි අතර ඒ වෙනුවට හවුල් ව්‍යාපාරයක ලක්ෂණ ලියා තිබුණි.

## <u>B - කොටස</u>

මෙම කොටසෙහි අනිවාර්ය ප්‍රශ්න 04ක් විය. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගත හැකිව තිබූ මුළු ලකුණු 40 කි.

### ප්‍රශ්න අංක 02

ප්‍රශ්නය "ව්‍යාපාර සංවිධාන" මත පදනම් වී තිබුණි.

**(a)** (i) අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම කොටසට නිසි ලෙස උත්තර ලියා නොතිබූ අතර තනි අයිතිය වෙනුවට පුද්ගලික ව්‍යාපාර වර්ග පිළිබඳව ලියා තිබුණි.

(ii) එවැනි ව්‍යාපාරයක ලක්ෂණ විමසා තිබූ අතර ඉහත **(i) කොටස** නිසි පරිදි වටහා නොගැනීම නිසා අයදුම්කරුවන් මෙම කොටසට ලකුණු ලබාගෙන නොතිබුණි.

(b) අයදුම්කරුවන්ගෙන් බහුතරය සීමාසහිත පොදු සමාගමක ලක්ෂණ පැහැදිලි කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. ඔවුන් අතරින් සමහරක් සීමාසහිත පොදු සමාගමක කොටස්හිමියන්ගේ නියමිත ගණන නිසි පරිදි හඳුනාගෙන නොතිබුණි. එනිසා ස්ව-අධ්‍යයන පොත් පරිශීලනය කර ස්ථාවර දැනුමක් අයදුම්කරුවන් විසින් ලබාගත යුතුය.

### ප්‍රශ්න අංක 03

රක්ෂණය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී.

(a) අයදුම්කරුවන්ගෙන් බහුතරය හොඳින් උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

(b) අයදුම්කරුවන්ගෙන් බහුතරය විමසා ඇති කාරණයට ඉලක්කගතව උත්තර නොලියා සාමාන්‍ය දැනුම ආශ්‍රිතව පැහැදිලි නොවන උත්තර ලියා තිබුණි. එනිසා ස්ව-අධ්‍යයන පොත්වලට යොමු වී තිරසාර දැනුමක් අයදුම්කරුවන් විසින් ලබා ගතයුතුයි.

(c) රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි රක්ෂණයේ දායකත්වය පැහැදිලි කිරීමට අපොහොසත් කම නිසා මෙම කොටසට වෙන්කර තිබු ලකුණු 4 න් ලකුණු 2 ක් පමණක් බොහෝ අයදුම්කරුවන් ලබාගෙන තිබුණි.

### ප්‍රශ්න අංක 04

(a) නිසිලෙස කළමනාකරණය කරන ලද බෙදා හැරීමේ ක්‍රමයක වාසි අයදුම්කරුවන්ගෙන් බොහොමයක් තේරුම්ගෙන තිබූ අතර ඔවුන් අතුරෙන් බොහෝ දෙනෙක් ඔවුන්ගේ සාමාන්‍ය දැනීම උපයෝගීකරගෙන මෙම කොටස පැහැදිලි කර තිබුණි.

(b) අයදුම්කරුවන්ගෙන් බොහොමයක් මාර්ගගත ක්‍රමයට ආහාර බෙදා හැරීමේ ක්‍රමය වටහාගෙන සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබු නමුත් මෙම කොටස ඔවුන් උත්තර ලබා දී තිබුණේ සාමාන්‍ය දැනීම උපයෝගී කරගෙනය.

(c) ODO මාර්ගගත බෙදා හැරීමේ ක්‍රම කෙරෙහි රජය මැදිහත් වන ආකාරය හා බලපෑම පැහැදිලි කිරීමට අපොහොසත් වීම නිසා අයදුම්කරුවන් බොහොමයක් සාමාන්‍ය ලකුණු ලබාගෙන තිබුණි.

කෙසේවෙතත් ඉහත ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක වූ අතර අයදුම්කරුවන් බොහොමයක් සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 05

වාණිජ බැංකුවල මුදල් හා සේවා වර්ග පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී.

(a) අයදුම්කරුවන් බොහොමයක් මුදල් වර්ග හඳුන්වා දක්වා සම්පූර්ණ ලකුණු උපයාගෙන තිබුණි.

(b) අයදුම්කරුවන් බොහොමයක් දී තිබූ සිදුවීම් නොසලකා හැර ඔවුන්ගේ සාමාන්‍ය දැනුම යොදාගෙන උත්තර සපයා සාමාන්‍ය ලකුණු උපයාගෙන තිබුණි.

(c) **"බණ්ඩාර තේ වෙළඳසැලේ"** ව්‍යාපාරික පරිසරය හඳුනා නොගත් අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම කොටසට නිසි පරිදි උත්තර සපයා නොතිබුණි. ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීමෙන් අත්වන ප්‍රතිලාභ වෙනුවට පරිසර දූෂණය සහ පාරිසරික සමතුලිතතාවය සුරකෙන සංවර්ධනය පිළිබඳව සමහර අයදුම්කරුවන් උත්තර ලියා නොතිබුණි.

# C - කොටස

## ප්‍රශ්න අංක 06

**රුබෙක්ස්** නැමැති සමාගමක් පිළිබඳව විෂය අධ්‍යයනයක් පාදක කරගත් ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර ඔවුන් අතුරෙන් බොහෝ දෙනෙක් සාමාන්‍යයෙන් හොඳ ලකුණු ලබාගත්හ.

(a) අන්තර්ජාතික වෙළඳාමේ යෙදීමෙන් ලබාගත හැකි වාසි පිළිබඳ ලියා ඉහළ ලකුණක් ලබාගැනීමට අයදුම්කරුවන්ගෙන් බහුතරය සමත් වූහ.

(b) **රුබෙක්ස් ආයතනය** ශද්‍ර අත (SWOT) විශ්ලේෂණයට ලක් කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් අඩු ගණනක් ශද්‍ර අත (SWOT) විශ්ලේෂණය නිසිලෙස හඳුනාගෙන තිබුණි. සමහරු ශද්‍ර අත (SWOT) වෙනුවට සාමජීය සහ පාරිසරික සාධක ගැන ලියා සාමාන්‍ය ලකුණු ලබාගෙන තිබුණි.

(c) රුබෙක්ස් ආයතනයට ප්‍රවාහන සේවාවන්ගේ වැදගත්කම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් බහුතරය සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

(d) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සාක්ෂාත්කර ගැනීම සඳහා රුබෙක්ස් ආයතනයේ දායකත්වය මත මෙම ප්‍රශ්නය පදනම් වී තිබුණි. කරුණු පැහැදිලි ලෙස විස්තර නොකිරීම නිසා අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසකට සම්පූර්ණ ලකුණු ලබාගත නොහැකි විය.

(e) ආයෝජකයන්ට කොළඹ කොටස් හුවමාරුව වැදගත් වීමට හේතු මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නය තේරුම් ගෙන නොතිබුණි. මෙම අයදුම්කරුවන් තම සාමාන්‍ය දැනීම මත කරුණු පැහැදිලි කිරීම තුළින් මෙම කොටසට අඩු ලකුණු ලබාගෙන තිබුණි. ඔවුන් අතුරෙන් සමහරෙකු කොළඹ කොටස් වෙළඳ හුවමාරුව සාමාන්‍ය වෙළඳ පොළක් ලෙස සඳහන් කර තිබුණි.

උත්තර ලිවීමට පෙර ප්‍රශ්නය කියවා හොඳින් තෙරුම් ගැනීම අවශ්‍යය.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) ප්‍රශ්ණ පත්‍රය ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවීම. (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(2) AAT විෂය නිර්දේශය/පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා, ලිවිය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු කෙටි උත්තර අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගත යුතුය.

(5) පිළිතුරු සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කල භාෂාවයි. සෑම නව ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු සැපයීම ආරම්භ කලයුත්තේ පිළිතුරු පොතේ අළුත් පිටුවකය. අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබිම ගැන සැළකිලිමත් විය යුතුය.

(6) උත්තර පත බාරදීමට පෙර සෑම පිටුවකම ප්‍රශ්න අංක සහ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(7) "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(8) දැනුම වැඩිදියුණු කරගැනීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(9) ඒඒටි ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යෙයන්ම කළ යුතුය.

(10) කිසිදු ප්‍රශ්නයක් මගහැරීම නොකලයුතුය. මෙම පුරුද්ද විභාගය අසමත් වීමට හේතුවක් විය හැක.

(11) හොඳ සූදානමකින් සහ විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටෙගන විභාගයට මුහුණ දීය යුතුය.

\- * * * -